# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1988/12 – 2016 ඔක්තෝබර් 11 වැනි අඟහරුවාදා – 2016.10.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් අමාත්‍ය ජෝන් ඇන්තනී එම්මානුවෙල් අමරතුංග වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, පොල්ගහවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, උඩපොල ඕතොට කෝරළේ සුළු කොට්ඨාසයේ, කහදිවල ගමේ පිහිටි, කුරුණෑගල දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් පිළියෙළ කරන ලද අංක කේයු/පීඑල්ජී/2014/279 සහ 2014.08.16 දිනැති ප්‍රගමන අනුරේඛනයේ කැබලි අක්ෂර 'ඒ' වශයෙන් පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්. 0.3133 ක් පමණ වූ පහත සඳහන් මායිම් තුළ පිහිටි ඉඩම් කොටස:

01. කැබලි අක්ෂර 'ඒ' – කෙහෙල්ඇල්ලේකුඹුර – ප්‍රමාණය: හෙක්. 0.3133

උතුරට: කු/අල් අක්ෂා මහා විද්‍යාලය හිමිකම් කියන කෙහෙල්ඇල්ලේ හේන; නැගෙනහිරට: එම්. බී. රාසික් සහ එන්. ඒ. රවුෆ්නෝනා හිමිකම් කියන කෙහෙල්ඇල්ලේහේන සහ එස්. බාලසිංහ හිමිකම් කියන කෙහෙල්ඇල්ලේකුඹුර; දකුණට: එස්. බාලසිංහ සහ ඒ. නන්දසේන හිමිකම් කියන කෙහෙල්ඇල්ලේකුඹුර; බටහිරට: ඇළ.

ජෝන් ඒ. ඊ. අමරතුංග,
ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 4-3/8/2013/පීසී/56.
2016 අගෝස්තු මස 18 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

10 – 1432